ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2010 ජුලි - 10 ශ්‍රේණිය

Genaral Certificate of Education (Ord. Level) Examination, July 2010 - Grade 10

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I , II
வணிகக் கல்வியும் கணக்கீடும் I , II
Business and Accounting Studies I , II

පැය තුනයි
*Three hours*

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලුව සියලු ම ප්‍රශ්ණ සඳහා පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. දේශිය පාවාහන් නිපදවන්නන්ගේ ප්‍රමුඛයා වීමේ අපේක්ෂාවෙන් යුතුව හිමාලි හා හුමාලි විසින් "මාලි සහෝදරයෝ" නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. ඉදිරි සැලසුම් අනුව සපත්තු නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය උපකරණ වෙනුවෙන් හිමාලි රු. 50,000ක් යෙදු අතර අනෙකුත් වියදම් පවත්වාගෙන යාම සඳහා හුමාලි රු. 100,000 ක මුදලක් යෙදවිය.

දෙදෙනා අතර ව්‍යාපාරය කරගෙන යාම පිළිබඳව ගිවිසුමක් ලිඛිතව පවත්වාගෙන ගිය අතර මහජන බැංකුවේ ජංගම ගිණුමක් රු. 10,000 ක් යොදා අරඹන ලදි. 2001.01.02 දින බැංකු කළමණාකරුත් සමග සාකච්ඡා කොට වසර 5ක් සඳහා මාසිකව පොලිය 12% ගෙවීමේ පදනම මත රු. 300,000 ක් ණයක් ලබා ගන්නා ලදි. ණ ය වාරික ගෙවීම ආරම්භ කරනුයේ මාර්තු 01 දින සිට ය. සපත්තු නිෂ්පාදනය කෘතිම සම් හා සතුන්ගේ සම් යොදා ගෙන සිදුකරන අතර නිෂ්පාදන උපකරණ සඳහා රු. 35,000 ක් වැය කර අදාල උපකරණ 2001.01.07 මිලදී ගන්නා ලදි.

හිමාලි ට අයත් ගොඩනැගිල්ලක් මාසික කුලිය රු. 10,000 බැගින් ගෙවීමේ පොරොන්දුව පිට ලබා ගත් අතර 2001.01.12 රු. 30,000 ක් යොදා අලුත් වැඩියා කරන ලදි. අලුත් වැඩියා වියදම කුලියෙන් හිලව් කරන ලදි. සෑම මසකම රු. 5,000 බැගින් වැටුපක් හවුල්කරුවන්ට හිමි අතර මාසය අවසාන වී 3 වනදින ගෙවනු ලැබේ.

2001 මාර්තු 01 දින වනවිට පහත තොරතුරු අණාවරනය විය.

| | | | |
|---|---|---|---|
| ණයට ගැණුම් | 300,000 | ණයහිමියන්ට මුදල් ගෙවීම් | 175,000 |
| මුදලට විකුණුම් | 400,000 | ණයට විකුණුම් | 50,000 |
| ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා | 35,000 | ලිපිද්‍රව්‍ය | 5,000 |
| වැටුප් - අත් උදව්කරු | 6,000 | විදුලිය | 2,500 |
| ජලබිල | 250 | අමතර වියදම් | 600 |

බැංකු පොලිය හා වාරිකය සෑම මසකම 31 ගෙවා දමන ලදි. ව්‍යාපාරය දියුණු වු පසු පෞද්ගලික සමාගමක් බවට පත්කිරීම හවුල්කරුවන්ගේ සැලැස්මයි.

01. මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන ගණයට අයත් වේ ද?
02. ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු පණත හා ආයතනය නම් කරන්න.
03. මෙම හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ සඳහන් කොන්දේසි දෙකක් නම් කරන්න.
04. අනාගතයේ මෙම ව්‍යාපාරය සමාගමක් බවට පත් කිරීමට ඉදිරිපත් කළ යුතු ලියවිලි මොනවා ද?
05. සමාගමක් බවට පත් කිරීමේ දි ලබා ගත හැකි වාසි 2ක් සඳහන් කරන්න.
06. "මාලි සහෝදරයෝ" ව්‍යාපාරය සඳහා සුදුසු දැක්මක් (Vision) ගොඩ නගන්න.
07. ගිවිසුමක් මෙම ව්‍යාපාරය තිබිම යෝග්‍ය වන්නේ ඇයි ?
08. මෙම ව්‍යාපාරය පුලුල් කර ඉදිරියට ගෙන යාම සඳහා සිටිය හැකි උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව කිය ද?
09. මෙම ව්‍යාපාරයේ ලාභ අලාභ බෙදා ගන්නේ කෙසේ ද? එම පිළිතුරට අදාල නීතිමය තත්වය පැහැදිලි කරන්න.
10. මෙම ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය කිය ද?

(ලකුණු 02 x 10 = 20 යි)

*හයවන පිටුව බලන්න*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## (ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න)

02. (i) අවශ්‍යතා හා වුවමනා වෙන වෙනම නිර්වචනය කරන්න.
   (ii) භාණ්ඩ හුවමාරු ක්‍රමයේ දුර්වලතා 4ක් ලියන්න.
   (iii) නිෂ්පාදන ක්‍රියාවලිය ගැලීම් සටහනක් මගින් පෙන්වන්න.
   (iv) ඒකීය බැංකුකරණය යනු කුමක් ද?
   (v) කාර්ය විශේෂීකරනය යනු කුමක් ද?

(ලකුණු 02 x 05 = 10 යි)

03. (i) අලෙවි සැලැස්මක අන්තර්ගත විය යුතු කරුනු 3ක් ලියන්න.
   (ii) චෙක්පත් රේඛණය කිරීමේ ප්‍රධාන අරමුණ කුමක් ද?
   (iii) සාර්ව පරිසරය හා සුක්ෂම පරිසරය සඳහා උදාහරණ දෙක බැගින් ලියන්න.
   (iv) ව්‍යාපාර සංවිධාන ලියාපදිංචි කිරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ 4ක් නම් කරන්න.
   (v) වාණිජ බැංකුවක ආරම්භ කළ හැකි ප්‍රධාන ගිණුම් නම් කර ව්‍යාපාරිකයකුට ඉන් ඉතා වැදගත් වන ගිණුම කුමක්ද?

(ලකුණු 02 x 05 = 10 යි)

04. එක්තරා නිෂ්පාදන ආයතනයකින් 2009.12.31 දිනට උපුටා ගන්නා ලද ශේෂයන් පහත දැක්වේ.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය තොග 2009.01.01 දිනට | රු. 15,600 |
| අමුද්‍රව්‍ය ගැණුම් | රු. 34,400 |
| නිෂ්පාදන වැටුප් - සෘජු | රු. 9,600 |
| යන්ත්‍ර අලුත් වැඩියා | රු. 10,600 |
| අමුද්‍රව්‍ය තොග 2009.12.31 දිනට | රු. 14,000 |
| යන්ත්‍ර ක්ෂය | රු. 15,400 |

ඔබ විසින් මෙහෙයුම් සැලැසුමක් පිළියෙල කර මේවා ගණනය කරන්න.

1. මුලු සෘජු පිරිවැය
2. මුලු පොදුකාර්ය පිරිවැය
3. වර්ෂය තුළ ඒකක 200 ක් නිෂ්පාදනය කර ඇත්නම් ඒකක පිරිවැය
4. නිෂ්පාදන පිරිවැය මත 25% ලාභයක් අපේක්ෂා කෙරේ නම් එකක් විකිණීමට ලකුණු කල යුතු මිල සොයන්න.

05. සිරිසේන පෙරේරා කොළොන්නාව මහජන බැංකුවේ අංක 108 00 4259 9 දරණ ජංගම ගිණුම් හිමිකරු වේ. 2010.07.25 දින කඩුවෙල හැටන් නැෂනල් බැංකුවේ අංක 0820 2020 2282 ජංගම ගිණුම් හිමියෙකු වන සෝමවති කාරියක්පෙරුම රු. 9,100.50 ක් වටිනා බඩු තොගයක් මිලට ගෙන ඒ සඳහා අංක 623261 දරණ චෙක්පත නිකුත් කරන ලදි. මෙය උපරිම ආරක්ෂාවක් ලැබෙන පරිදි රේඛණය කර තිබුණි. මෙම දත්ත ආධාරවෙන් චෙක්පතක දළ ආකෘතියක් ඇඳ පෙන්වන්න.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර
විසින් සම්පාදිත යි.